විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය
වෙளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு
MINISTRY OF FOREIGN AFFAIRS, FOREIGN EMPLOYMENT AND TOURISM

**මාධ්‍ය නිවේදනය**

## ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (CRPD) යටතේ ශ්‍රී ලංකාවේ සමාලෝචනය ජිනීවාහිදී

ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුව (CRPD කමිටුව), 2026 අගෝස්තු 14 වැනි දින ජිනීවාහිදී පැවැත්වෙන එහි 35 වැනි සැසියේදී, ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (CRPD) යටතේ ශ්‍රී ලංකාවේ මූලික වාර්තාව සමාලෝචනය කරනු ඇත.

ශ්‍රී ලංකා රජයේ නියෝජිත කණ්ඩායම සහ ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කමිටුව අතර සමාලෝචනය අන්තර්ක්‍රියාකාරී සංවාදයක් ලෙස පැවැත්වෙනු ඇත. නියෝජිත කණ්ඩායමේ සාමාජිකයින් ජිනීවා වෙත පැමිණීමෙන් සහ කොළඹ සිට මාර්ගගත ලෙස සහභාගී වේ.

ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍ය ආචාර්ය උපාලි පන්නිලගේ විසින් සමාලෝචනය සඳහා සහභාගී වන ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ නායකත්වය දරනු ලැබේ.

ජිනීවාහි දී සමාලෝචනයට සහභාගී වන නියෝජිත පිරිසට, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයේ, විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශයේ සහ නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ ජිනීවාහි එක්සත් ජාතීන්ගේ කාර්යාලයේ ශ්‍රී ලංකා නිත්‍ය දූත මණ්ඩල නිලධාරීන් සහ අනෙකුත් ජාත්‍යන්තර සංවිධානවල නිලධාරීන් ඇතුළත් වේ.

කොළඹ සිට මාර්ගගතව සහභාගී වන නියෝජිත කණ්ඩායමට අදාළ අනෙකුත් අමාත්‍යාංශ සහ ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ නියෝජිතයින් ඇතුළත් වේ.

ශ්‍රී ලංකාව, 2016 දී, ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (CRPD) අපරානුමත කළ අතර, 2019 ඔක්තෝම්බර් මාසයේදී සම්මුතිය යටතේ එහි මූලික වාර්තාව ඉදිරිපත් කළේය. 2025 දෙසැම්බර් මාසයේදී, කමිටුව විසින් ඉදිරිපත් කළ ගැටළු ලැයිස්තුවකට ද වැඩිදුර තොරතුරු ලබාදෙමින්, ශ්‍රී ලංකාව ප්‍රතිචාර දැක්වීය. ශ්‍රී ලංකාව සම්මුතිය ක්‍රියාත්මක කිරීම පිළිබඳව ඇගයීමට සහ ආබාධ සහිත පුද්ගලයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට ගන්නා පියවර පිළිබඳව ඵලදායී සංවාදයක නිරත වීමට මෙම සමාලෝචනය ශ්‍රී ලංකා රජයට සහ කමිටුවට අවස්ථාවක් ලබා දෙනු ඇත.

2026 අගෝස්තු 12 සිට 27 දක්වා ජිනීවාහි පැවැත්වෙන කමිටුවේ 35 වන සැසිවාරයේදී, ශ්‍රී ලංකාව සමඟ ස්ලෝවැකියාව, කටාර්, ලිතුවේනියාව සහ චිලී යන රටවල් ද සමාලෝචනයට ලක් වේ.

**විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය**
**කොළඹ**

**2026** අගෝස්තු **13** වැනි දින


**Foreign Affairs**
විදේශ කටයුතු
வெளிநாட்டு அலுவல்கள்

**Republic Building, Colombo 1**
ජනරජ ගොඩනැගිල්ල, කොළඹ 1
குடியரசுக் கட்டிடம், கொழும்பு 1
2 325 373/5, 2 207 200/7
cypher@mfa.gov.lk

**Foreign Employment**
විදේශ රැකියා
வெளிநாட்டு வேலைவாய்ப்பு

**17th Floor, "Mehewara Piyesa", Narahenpita, Colombo 5**
17 වන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 5
17 ஆவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 5
2 331 200
info@mfe.gov.lk

**Tourism**
සංචාරක
சுற்றுலாத்துறை

**No 03, Times Building, Bristol Street (Sir Razik Fareed Mw), Colombo 1**
අංක 03, ටයිම්ස් ගොඩනැගිල්ල, බ්‍රිස්ටල් වීදිය (සර් රාසික් ෆරීඩ් මාවත), කොළඹ 1
இல.03, டைம்ஸ் கட்டிடம், பிரிஸ்டல் தெரு (சர் ராசிக் ஃபரீத் மாவத்தை), கொழும்பு 1
2 381 798, 2 321 222
secretary@tourismmin.gov.lk